# රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
## அரச கணக்குகள் திணைக்களம்
## Department of State Accounts


මගේ අංකය / எனது இல. / My No. SA/MA/MA-02/Assets    ඔබේ අංකය / உமது இல. / Your No.    දිනය / திகதி / Date 2019.08.26

ප්‍රධාන මූල්‍ය නිලධාරී/ අධ්‍යක්ෂ මූල්‍ය/ ප්‍රධාන ගණකාධිකාරී,

..........................................................................................

**<u>මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කිරීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් වූ මාගේ අංක SA/MA/MA-02/Assets සහ 2019.07.03 දිනැති ලිපිය හා බැඳේ.

02. ඉහත සඳහන් ලිපියේ දැනුම් දුන් පරිදි ආරම්භක ශේෂ ලෙස මෙතෙක් ගිණුම්ගත නොකළ මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කිරීමට ලබාදුන් අවසාන දිනය 2019 අගෝස්තු 31 දින වේ. ඒ අනුව එම දිනයෙන් පසුව CIGAS පරිගණක පද්ධතිය හරහා මූල්‍ය නොවන වත්කම්වල ආරම්භක ශේෂයන් ගිණුම්ගත කිරීම අවුරා තැබීමට අදහස් කරනු ලබන බැවින් ඊට ප්‍රථම එම කටයුතු අවසන් කරන ලෙසත්, එම දිනයෙන් පසුව හඳුනාගත් ආරම්භක ශේෂයන් වේ නම් ඒවා ගිණුම්ගත කිරීම මෙම දෙපාර්තමේන්තුවේ අවසරය මත පමණක් කළ යුතුවන බවත් කාරුණිකව දන්වා සිටිමි.

03. එසේම 2019.08.31 දිනට භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව මූල්‍ය නොවන වත්කම් ශේෂයන් CIGAS Web Interface වෙත upload කර ඇති ශේෂයන් සමඟ සැසඳීමක් මෙම දෙපාර්තමේන්තුව විසින් සිදුකිරීමට නියමිතය. එබැවින්, එම දින දක්වා ආරම්භක ශේෂයන් ද සහිතව යාවත්කාලීන කරන ලද මූල්‍ය නොවන වත්කම් නිසි පරිදි BOS වාර්තාවට ඇතුලත් කර 2019.09.09 පෙ.ව. 9.00ට ප්‍රථම පෙර ලබාදී ඇති උපදෙස් අනුව CIGAS Web Interface වෙත upload කිරීමට කටයුතු කළ යුතුය. එදිනට CIGAS Web Interfaceහි පවතින මූල්‍ය නොවන වත්කම් ශේෂ 2019.08.31 දිනට භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව ශේෂ සමඟ නොසැසඳේ නම් සැප්තැම්බර් මාසය තුළදීම ඒ සඳහා සැසඳුම් ප්‍රකාශයක් පිළියෙළ කර අදාල පරිදි ගිණුම් සංශෝධනය කළ යුතුය.

04. මාරු පත්‍ර හරහා භාණ්ඩාගාර පොත් සංශෝධනය කරගැනීමට සිදුවන අවස්ථාවල දී අදාළ ආයතන ඒ සඳහා වූ මාරු පත්‍ර 2019.08.31 දිනට පෙර මෙම දෙපාර්තමේන්තුව වෙත ලැබෙන සේ එවීමට කටයුතු කළ යුතුය.

05. මෙම ලිපිය මගින් දන්වා ඇති කරුණු පිළිබඳ ප්‍රධාන කාර්යාල විසින් තම ආයතන යටතේ ක්‍රියාත්මක සියලුම මධ්‍යම කාර්යාල (Mid Office) හා උප කාර්යාල (Sub Office) දැනුවත් කිරීමට කටයුතු කළ යුතු ය.

06. ඒ අනුව ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කිරීමට අදාළ ගැටළු සම්බන්ධයෙන් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාන (2 484 649) ද / අනිකුත් මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කිරීමට අදාළ ගැටළු සම්බන්ධයෙන් සහකාර අධ්‍යක්ෂ, සාර්ව හා උපචිත ගිණුම් (2 484 730) ද, තාක්ෂණික ගැටළු සම්බන්ධයෙන් නියෝජ්‍ය අධ්‍යක්ෂ, පද්ධති සංවර්ධන හා පුහුණු (2 484 826) අමතා වැඩිදුර තොරතුරු ලබාගන්නා ලෙස කාරුණිකව දන්වමි.

ආර්.එම්.ඒ. රත්නායක
අධ්‍යක්ෂ ජනරාල්


මහා භාණ්ඩාගාරය, කොළඹ 01, ශ්‍රී ලංකාව. பொது திறைசேரி, கொழும்பு 01, இலங்கை. General Treasury, Colombo 01, Sri Lanka.
General - Tel.: +94 11 2484500/600 Ext.: 1149 Fax : +94 11 2484869 Website : www.sad.gov.lk
Director General - Tel.: +94 11 2484728 Fax : +94 11 2473856 e -mail : dgsa@sad.treasury.gov.lk